00020

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2021/2022
අවසාන පරීක්ෂණය
**STP 9632** - අධ්‍යාපනයේ පරිගණක තාක්ෂණය
කාලය - පැය තුන (03) යි.

---

දිනය : **2023.06.25** වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**
**විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී එකම පාඩමක් උදාහරණ ලෙස දැක්වීමෙන් වළකින්න.**

01. "නිර්මාණාත්මක පෙළගැන්නුම යනු ඉගෙනුම් ක්‍රියාවලියට පෙර සිසුන් ඉගෙන ගත යුතු දේ කුමක් ද සහ ඔවුන්ගේ ඉගෙනුම ප්‍රකාශ විය යුත්තේ කෙසේද යන්න පැහැදිලිව දක්වා ඇති සැළසුමක් වේ." (Biggs,2014)

(i) තෝරාගත් පාඩමක් සඳහා ඔබ විසින් ක්‍රියාත්මක කරන ලද ඉගෙනුම් අත්දැකීමක් නිදසුන් ලෙස සපයමින් නිර්මාණාත්මක පෙළ ගැන්නුම විස්තර කරන්න. (ලකුණු 40)

(ii) දෘෂ්‍යාමය සංවිධානයක් ලෙස මෙන් ම සංකල්ප නිරූපකයක් ලෙස, සංකල්ප සිතියමක් ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීමේ දී උපකාර වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 30)

(iii) ඉගෙනුම් අත්දැකීම් සැළසුම් කිරීමේ දී, උපදේශනයේ පළමු මූලධර්ම (Meril,2012) සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 30)

02. ගුරු භූමිකාව " විෂය අන්තර්ගතය සම්ප්‍රේෂණය කරන්නෙකු" ගේ සිට " ඉගෙනීම සඳහා පහසුකම් සළසන්නකු" ලෙස වෙනස් ව ඇත.

(i) ඔබ උගන්වනු ලබන පාඩමකට අදාළව කරුණු පහක් (05) දක්වමින් ඉගෙනීම සඳහා පහසුකම් සැලසිය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii) සුදුසු උදාහරණ දක්වමින්, තාක්ෂණය භාවිතයෙන් ඉගෙනුම අර්ථවත් කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 30)

**(ii)** තෝරාගත් පාඩමක් සඳහා තාක්ෂණය යොදා ගනිමින් අර්ථවත් කර ඔබ විසින් ඔබේ සිසුන් සඳහා නිර්මාණය කල ඉගෙනුම් අත්දැකීමක් පැහැදිලි කරන්න. (ලකුණු 40)

03. විවිධ හේතූන් නිසා වර්තමාන සන්දර්භට තුළ අංකිත (Digital) ඉගෙනුම ඉතා ඵලදායී වී ඇත.

(i) සුදුසු උදාහරණ දක්වමින්, අංකිත (Digital) ඉගෙනුමෙහි අර්ථය සහ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii) තෝරාගත් පාඩමක ඉගෙනුම් ක්‍රියාවලියට සහයවීම සඳහා යොදාගත හැකි මෘදුකාංග වර්ග/ අංකිත මෙවලම් **පහක් (05)** පැහැදිලි කරන්න. (ලකුණු 30)

(iii) ඔබේ පාඩම් සඳහා අංකිත මෙවලම් භාවිත කිරීමේ දී ඔබ මුහුණ දුන් අභියෝග **පහක් (05)** වත්, මෙන් ම එම අභියෝග ජය ගැනීමට ඔබ යොදාගත් උපාය මාර්ග ප්‍රත්‍යාවේක්ෂණය කරන්න. (ලකුණු 40)

04. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක් ලෙස විශ්ව විසිරි වියමන (world wide web) වැඩි වැඩියෙන් භාවිත වේ.

(i) අවශ්‍යතා පහ **(05)** පැහැදිලි කරමින්, මාර්ගගත ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි වැදගත්කම සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 30)

(ii) අර්ථවත් ඉගෙනීම සඳහා වැදගත්වන අයුරු දක්වමින් වෙබ් (web) පාදක ඉගෙනුම් පරිසරයක් තුළ දක්නට ලැබෙන ලක්ෂණ **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 30)

(iii) ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) සමඟින් ඉගෙනීමේ දී ඔබේ පෞද්ගලික අත්දැකීම් ප්‍රත්‍යාවේක්ෂණය කරන්න. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක මූලිකාංග (fundamentals) එම ඉගෙනුම් පරිසරය තුළ ඵලදායී ලෙස අන්තර්ගත කර ඇති ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 40)

05. අධ්‍යාපනික වැඩසටහන් සංවර්ධනය කිරීමේ දී සැළකිල්ලට ගතයුතු මූලිකාංග, උපදේශන සැළසුම් පද්ධති ආකෘතින්හි (Instructional Design System Models) අර්ථ දක්වනු ලබයි.

(i) තාක්ෂණය හෙබි ඉගෙනුම් ද්‍රව්‍ය (TEL) නිර්මාණය කිරීමේ දී ADDIE උපදේශන ආකෘතියේ භාවිතය පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii) ඔබ නිර්මාණය කළ TEL ද්‍රව්‍ය ඇගයීමට අදාළව, සැළසුම් අංග හතරෙහි **(04)** ඇගයීම පහත එක් එක් අවස්ථාවන්ට අදාළව පැහැදිලි කරන්න.
- ඇගයීම් ප්‍රශ්න තීරණය කිරීම.
- ඇගයීම් නිර්ණායක සංවර්ධනය කිරීම.
- සුදුසු ඇගයීම් උපකරණ තෝරා ගැනීම. (ලකුණු 40)

(iii) සැළසුම් අංග හතර (04) ම ආවරණය වන පරිදි ගුණාත්මක තොරතුරු රැස් කිරීම සඳහා ඇගයීම් උපකරණයක් සකස් කරන්න. (ලකුණු 30)

06. විවෘත අධ්‍යාපනික සම්පත් (OER), ඔරොත්තු දීමේ සහ ප්‍රවේශවීමේ බාධක බිඳ දමමින් සිසුන්ගේ ඉගෙනීම පුළුල් කරන බව පෙන්වා දී ඇත.

(i) නිර්මාණාත්මක පොදු බලපත්‍ර (Creative Common License) වර්ග සුදුසු පරිදි දක්වමින්, OER හි 5R රාමුව පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii) OER මගින් අධ්‍යාපනයේ 'විවෘතභාවය' සහතික වන අයුරු උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 40)

(iii) ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා OER භාවිතයේ දී ඔබ මුහුණ දුන් ප්‍රායෝගික දුෂ්කරතා තුනක් **(03)** සහ ඒවා අවම කර ගැනීමට ඔබ අනුගමනය කළ උපායමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 30)

හිමිකම් ඇවිරිණි.